**ශීර්ෂ 127 - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 127 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 2015.07.08 |
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව | 2015.06.24 |

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,776.5 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,669.6 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 19.1 ක් හා රු. මිලියන 87.8 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7.2 ක් හා සියයට 5.8 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| 127 | 264.8 | 245.7 | 19.1 | 7.2 |
| 221 | 1,511.7 | 1,423.9 | 87.8 | 5.8 |
| එකතුව | **1,776.5** | **1,669.6** | **106.9** | **6.0** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 127 | 5.5 | 5.3 | 2.0 | 3.5 | 20.0 | 15.6 |
| 221 | 100.0 | 76.1 | 45.0 | 72.9 | 295.0 | 237.7 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 0.25 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 743.9 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0040/000 | 1.2 |
| - එම - | 6000/0000/00/0015/0175/000 | 14.1 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0102/000 | 728.3 |
| - එම - | 6000/0000/00/0006/0029/000 | 0.3 |
| **එකතුව** | | **743.9** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

## 3. ශීර්ෂ 127 - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

## 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | යාවත්කාලීන කර නොතිබුණි |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1). | පවත්වා නොතිබුණි. |
| (ඈ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341. | පවත්වා නොතිබුණි. |
| (ඉ) | මෝටර් වාහන ලැයිස්තුව | මුදල් රෙගුලාසි 1647(ඉ) | යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.2 විසර්ජන ගිණුම

### 3.2.1 අයවැය විචලනය

වැය විෂයයන් 17 ක් සඳහා එකතුව රු.12,913,268 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 91 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.1,032,664 ක්වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ව්‍යාපෘති ලේකම් කාර්යාලයේ "ආබාධිත පුද්ගලයින්ට රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට" ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 2012 දෙසැම්බර් 10 දින ලබා දී තිබුණු රු.300,000 ක්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොයොදවා 2014 දෙසැම්බර් 31 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 12701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.824,013 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### අභ්‍යන්තර විගණනය

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අමාත්‍යාංශය සතු වාහන 06ක් ධාවන තත්ත්වයේ නොමැති නිසා ධාවනයෙන් ඉවත්කර තිබුණු බව 2014 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව නිරික්ෂණය වු අතර ඒවා මුදල් රෙගුලාසි 772 ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

මුදල් රෙගුලාසි 1647(ආ) ප්‍රකාරව වාහනද ඒවායේ උපකරණද පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද, අමාත්‍යාංශය විසින් වාහනවල උපකරණ සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත 2015 ජුනි 16 දිනටත් ඉදිරිපත් කර නොතිබුණි.

### (ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

අධිකරණ අමාත්‍යාංශය වෙත 2015 පෙබරවාරි 26 දින රැගෙන ගිය වාහන 03ක් නැවත අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### (ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

අමාත්‍යාංශය වෙත අධිකරණ අමාත්‍යාශයෙන්, ක්‍රීඩා අමාත්‍යාංශයෙන්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් සහ කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය යන ආයතනවලින් ලැබුණු වාහන 6 ක් නිත්‍යානුකූලව 2015 ජුනි 16 දින වන විටත් පවරාගෙන නොතිබුණි.

### (ඉ) බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.1,310,172ක් වූ අතර, ඒවා වර්ෂයකට වඩා අඩු කාලයක සිට පැවැත එමින් තිබුණි. වැය විෂයයන් දෙකකට අදාල වු රු.193,602 ක බැරකම් විසර්ජන ගිණුමේ හෙලිදරව් කර නොතිබුණි.

## 3.7 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්වාසනීය තොරතුරු බෙදාහැරීමේ අරමුණින් කම්කරු ගැසට් 4 ක් සැකසීම හා ප්‍රසිද්ධ කිරීමට ඉලක්ක කර තිබුණු අතර ගැසට් 2 ක් පමණක් 2014 වර්ෂයේදී ප්‍රසිද්ධ කර තිබුණි.

(ii) ජාතික මට්ටමේ ත්‍රෛපාර්ශවීය රැස්වීම් 10 ක් පැවත්වීමට ඉලක්ක කර තිබුණු අතර වර්ෂයේ රැස්වීම් 4 ක් පමණක් පවත්වා තිබුණි.

(iii) ව්‍යාපෘති ලේකම් කාර්යාලය විසින් වැටුප් සහිත (විධිමත්) රැකියා ප්‍රචාරාත්මක වැඩසටහන් වෙනුවෙන් වැඩමුළු 04 ක් ද, සේවා ස්ථානය තුළ විනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සේවක පුහුණු ප්‍රවර්ධන අභිප්‍රේරක වැඩ සටහන් 02 ක් ද පැවැත්වීමට ඉලක්ක කර තිබුණු අතර එම වැඩමුළු සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

### (ආ) සැලැසුම් කිරීම

ක්‍රියාකාරී සැලැස්ම තුළින් 2014 අවසාන කාර්තුවේ නිම කිරීමට සැලැසුම් කළ වාර්තාවක් ප්‍රකාශයට පත් කිරිමට රු.732,664 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර අදාල කාර්යය ඉටු නොකර එම මුදල් අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනටත් රඳවාගෙන තිබුණි.

## 3.8 පාඩු හා හානි

අමාත්‍යාංශයේ වාහන 07 කට 2013 හා 2014 වර්ෂයන්හිදී සිදු වූ අනතුරු 07 ක් පිළිබඳව මුදල් රෙගුලාසි 104(3) හා මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එමගින් සිදුවූ අලාභය වන රු.10,387,453 පියවා ගැනීමට 2015 මැයි 12 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) විධිමත් අනුමැතියකින් තොරව කම්කරු හා කම්කරු අමාත්‍ය කාර්යාලය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය අලංකරණයට සතියකට දෙවතාවක් බැගින් ස්වභාවික මල් මිලදී ගැනීමට 2014 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් රු.226,600 ක් වැයකර තිබුණි.

(ආ) නියෝජ්‍ය ඇමතිතුමාගේ ඉල්ලීමකට අනුව, විධිමත් අනුමැතියකින් තොරව නව අවුරුදු සුභ පැතුම්පත් 9500 ක් මුද්‍රණය කිරීමට අමාත්‍යාංශය විසින් රු.139,000 ක් 2014 වර්ෂයේදී වැයකර තිබුණි.

**3.10 අනාර්ථික ගනුදෙනු**

---

2014 ජූනි මාසයේදී රු.13,451,562 කට මිලදී ගත් මෝටර් රථය 2014 ඔක්තෝබර් මාසයේදී අනතුරට ලක්ව 2015 ජූනි 29 දින දක්වාම අළුත්වැඩියාවන් කළ නොහැකිව ගරාජයක තබා තිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

---

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 12 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 71 | 52 | 19 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 31 | 22 | 09 |
| | **එකතුව** | **121** | **90** | **31** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 31 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සංවර්ධන නිලධාරීන් 4 දෙනෙකු තෙවසරක කාලයකට සමාලෝචිත වර්ෂයේදී ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයට නිදහස් කර තිබුණි.

## 4. ශීර්ෂ 221- කම්කරු දෙපාර්තමේන්තුව

### 4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව | යාවත්කාලීන කර නොතිබුණි. |
| ( ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව | පවත්වා නොතිබුණි. |
| (ඈ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව | යාවත්කාලීන කර නොතිබුණි. |

## 4.2 විසර්ජන ගිණුම

-----------------

### 4.2.1 අයවැය විචලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සේවක අර්ථසාධක අරමුදල සඳහා වන වියදම**

--------------------------------------------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙහි සේවක අර්ථසාධක අරමුදලට රු.474,600,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සළසා තිබුණු අතර එයින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ලෙස පිළිවෙලින් රු.393,006,045 ක්ද, රු.48,597,302ක්ද, වශයෙන් එකතුව රු.441,603,347ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) සේවක අර්ථසාධක අරමුදලට දෙපාර්තමේන්තුව විසින් කරන වියදම්, කම්කරු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේද සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලද සටහන් කිරීම නිසා එක් වියදමක් වෙන් වෙන් වූ මූල්‍ය ප්‍රකාශන දෙකක සටහන් කර තිබුණි.

(ii) අරමුදලේ වියදම් ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳව කිසිදු සටහනක් හෝ මෙම වියදම් නාමමාත්‍ර වියදමක් බව හෝ විසර්ජන ගිණුමෙහි සඳහන් කර නොතිබුණි.

(iii) අරමුදල සඳහා වන වියදම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපූර්ණය කිරීම තුළින් මෙම අරමුදලට ස්වාධීනව කටයුතු කළ හැකි බව පෙන්වා දී තිබියදී, ආයතන දෙකක ගිණුම්කරණ ක්‍රියාවලියක් අනුගමනය කිරීමට හේතු විගණනයට පැහැදිලි නොවිණි.

(iv) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් තවදුරටත් ලැබිය යුතු රු.76,201,235 ක මුදල පිළිබඳව විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 31 කට රු.77,637,931 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**4.3 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.133,323,434 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 12 ක සිට කිසිදු ගනුදෙනුවක් සිදුකර නොමැති අංක 6000/0000/00/0006/0029/000 දරන ආගමන අරමුදල බැංකු ගිණුමෙහි රු.311,295 ක ශේෂය සනාථ කර ගැනීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) එක් එක් මාසය සඳහා පොදු 71 දරන ආකෘති පත්‍රයෙහි පිළියෙල කරන මාසික තැන්පත් සාරාංශ ප්‍රකාශ ඊලග මාසය අවසාන වීමට පෙර විගණකාධිපති වෙත 2014 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර නොතිබුණි.

**4.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටව තිබුණු වර්ෂ 01 සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන රු.5,203,655 ක ණයශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**4.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.5.1 විගණන හා කළමනාකරණ කමිටුව**

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පත්කර ක්‍රියාත්මක කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

**4.6 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත දක්වා ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

| වත්කම් අයිතමය | මිලදී ගැනීමට හේතුව | ප්‍රමාණය | මිලදී ගත් දිනය | වටිනාකම රු. | නිෂ්ක්‍රියද/ඌන උපයෝජිතද යන වග |
|---|---|---|---|---|---|
| Access Point | කම්කරු පරීක්ෂණ, පැමිණිලි හා නඩු පරිගණක ගත කිරීම | 16 | 2014.09.24 | 94,400 | සැලැසුම් අංශයේ ගබඩාවේ ගබඩා කර තිබුණු බැවින් නිෂ්ක්‍රියව තිබුණි. |
| USB Adaptor | - එම - | 112 | 2014.09.24 | 224,000 | |
| පරිගණක | උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට කම්කරු පරීක්ෂණ, පැමිණිලි හා නඩු පරිගණක ගත කිරීම. | 08 | 2013 | ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් ලබා දී තිබුණි. | පරිගණක 04 ක් නිෂ්කාර්යව සහ පරිගණක 04 ක් ඌන උපයෝජිතවද 2014.09.24 දිනට තිබුණි. |

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව සතුව 2014 දෙසැම්බර් 31 දිනට වාහන 93 ක් පැවති අතර මුදල් රෙගුලාසි 757(2) හා 1647(ආ) ප්‍රකාරව සියළුම වාහන පිළිබඳ සමීක්ෂණයක් පවත්වා විගණකාධිපති වෙත සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ 2013 දෙසැම්බර් 31 දිනැති අංක SAV/ML & LR/2012/01 දරන තක්සේරු වාර්තාව අනුව 2014 ජනවාරි 01 දිනට දෙපාර්තමේන්තුවේ වත්කම් අයිතම 47 ක වටිනාකම වූ රු.3,628,370,000 ක්

විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ආරම්භක ශේෂය ලෙස දක්වා නොතිබුණි.

## 4.7 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 15/2007 දරන කම්කරු දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව කම්කරු නිලධාරියෙක් මසක් තුළ අවම වශයෙන් කාලීන පරීක්ෂණ 20 ක් පැවැත්විය යුතු විය. උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරීන් 12 දෙනෙකු විසින් 2014 වර්ෂයේදී එක් නිලධාරියෙකු කාලීන පරීක්ෂණ 20 ට අඩුවෙන් සිදුකළ අවස්ථා 50 ක් පැවැතුණි. මේ හේතුවෙන් කාලීන පරීක්ෂාවන් අත්හැරී තිබුණු ආයතන ගණන 243 ක් විය. තවද එම චක්‍රලේඛයේ 5.1 ඡේදයේ ප්‍රකාරව එක් එක් කම්කරු නිලධාරීන් පවත්වාගෙන යන දිනපොත් ඊලඟ මාසයේ 10 දිනට පෙර සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ 2014 වර්ෂයේදී දින පොත් භාරදීම පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂණයේදී අවස්ථා 120 කදි දින පොත් භාරදීමට දින 06 ක සිට දින 50 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

(ii) 2011 අප්‍රේල් 29 දිනැති අංක 06/2011 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2 ඡේදයේ ප්‍රකාර පැමිණිල්ලක් ලැබී දින 14ක් ඇතුළත එය විභාග කර විසඳීමට පියවර ගත යුතු වුවත්, උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට විගණන දිනය වූ 2015 ජනවාරි 29 දිනට ලැබුණු පෙත්සම් හා පැමිණිලි 103 ක් විසඳා අවසන් කිරීමට මාස 13 සිට මාස 30 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි.

(iii) 2000 පෙබරවාරි 10 දිනැති අංක 6/2000 දරන කම්කරු දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 1(iv) ඡේදය ප්‍රකාරව දිගු කාලයක් පරීක්ෂාවට භාජනය නොවූ ආයතන පරීක්ෂාව සඳහා පළමුව තෝරා ගත යුතු වුවත්, උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ 2012, 2013 හා 2014 යන වර්ෂ තුනෙහි පරීක්ෂාවට භාජනය

නොවූ ආයතන සංඛ්‍යාව 5,575ක් වූ අතර එය ඉහත සඳහන් කාර්යාලය පිහිටි බල ප්‍රදේශයට අයත් ආයතන ප්‍රමාණයෙන් සියයට 72 ක් වී තිබුණි.

## 4.8 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

**දිස්ත්‍රික් කම්කරු කාර්යාල සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම.**

කාර්යාල ගොඩනැගිලි පහක් (05) ඉදිකිරිම සඳහා රු.මිලියන 199.62 ක් මධ්‍යකාලීන වියදම් රාමුව තුළ වියදම් කිරිමේ නිර්දේශය 2011 අගෝස්තු 22 දිනැති අංක NPD/HDC දරන ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් ලබා දී තිබුණි.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට කාර්යාල 03 ක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමට දෙපාර්තමේන්තුවේ තාක්ෂණික ඇගයිම් කම්ටුව නිර්දේශ කළද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ගොඩනැගිලි 05 ම ඉදිකිරිම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දීම අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) මිලගණන් කැඳවීමේදි කම්කරු කාර්යාල දෙකක් සඳහා කිසිදු ඇස්තමේන්තු හෝ සැලැසුම් ඉදිරිපත් නොකර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට එම ගොඩනැගිලි දෙකද ඇතුළත්ව ගොඩනැගිලි 5 ම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තු 2012 ජුලි 13 දින ලබා දී තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවල උපරිම සීමාවන් දැක්වෙන උපලේඛන අනුව රු.මිලියන 50 කට වැඩි හෝ සමාන වටිනාකමක් සහිත ප්‍රධාන කොන්ත්‍රාත්තු වැඩ සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරිය ලබා ගත යුතු වුවත්, ඊට පටහැනිව මෙම ගොඩනැගිලි ඉදිකිරිමේ කටයුතු සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත සිදු කර තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, දේශිය අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ජාතික තරගකාරි ලංසු කැදවීමේ ක්‍රමය අදාල කරගත යුතු වුවද, කම්කරු දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල පහ ඉදිකිරිමට වෙළඳපල මිල සැදහුම් ක්‍රමය (shopping) අදාල කර ගෙන තිබුණි.

(iv) මෙම වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය මගින් ලංසුකරුවන් තෝරා ගැනිමේදි වුවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමයේදි පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටිය ප්‍රකාරව “ඉක්ටාඩ්” ආයතනයේ ලේඛනගත කොන්ත්‍රාත්කරුවන් 05 කට නොඅඩු සංඛ්‍යාවකින් මුද්‍රා තැබූ මිල ගණන් කැදවීමක් සිදු කළ යුතු වුවද, මෙම කොන්ත්‍රාත්තුව සඳහා ආරාධිත ලංසුකරුවන් තිදෙනෙකුගෙන් කැදවූ මිල ගණන් වලින් ආයතන දෙකක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. මේ නිසා ගුණාත්මකභාවයෙන් ඉහල අඩු මිල ගණන් සහිත කොන්ත්‍රාත් ආයතනයක් තෝරාගැනිමේ අවස්ථාව දෙපාර්තමේන්තුව විසින් අහිමි කරගෙන තිබුණි.

(v) මෙම ඉදිකිරිම සඳහා 2012 මැයි 10 දින ලද අමාත්‍ය මණ්ඩල තිරණය පරිදි ගොඩනැගිලි ඉදිකිරිමේදි අඩු පිරිවැයක් සහිත සම්මත ගෘහ නිර්මාණ සැලැසුම්වලට අනුකූලව අදාල ඉදිකිරිමේ කාර්යයන් ඉටු කළ යුතු බවට අවධාරණය කර තිබුණත්, ඊට පටහැනිව වැඩි පිරිවැයක් සහිත ඇස්තමේන්තු හා ගෘහ නිර්මාණ සැලැසුම් තෝරාගෙන තිබුණි.

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ව්‍යාපෘතියක් නියමිත කාලය තුළ අවසන් කරන බවට සහතික වීම පිණිස එක් එක් ක්‍රියාවන්හි ප්‍රසම්පාදන කාලසටහන් සකස් කිරීම හා නිතිපතා යාවත්කාලීන කිරිම ප්‍රසම්පාදන අස්ථිත්වයේ වගකිම වුවද, මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි.

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කර දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කර යාවත්කාලීනව පවත්වාගත යුතු වුවත්, මෙම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු සකසා අනුමත කරගෙන නොතිබුණි.

(viii) ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය කම්කරු දෙපාර්තමේන්තුවට 2015 අප්‍රේල් 21 දින වන විටත් පවරා ගෙන නොතිබුණි.

(ix) මීගමුව කම්කරු කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් මාසය වන විට ප්‍රමාණපත්‍ර පරීක්ෂා නොකර හා වැඩබිමේ කටයුතු අධීක්ෂණයකින් තොරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.45,782,710 ක් ගෙවා තිබුණි.

(x) මීගමුව කම්කරු කාර්යාලය පවත්වාගෙන ගිය පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරිමේදි එම ගොඩනැගිල්ලේ තිබුණු ප්‍රයෝජනයට ගත හැකි භාණ්ඩවල වටිනාකම රු.590,910 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද, විගණන දිනය වූ 2015 අප්‍රේල් 21 දින දක්වා මෙම භාණ්ඩ වත්කම් ලෙස සළකා ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(xi) 2011 වර්ෂයේදි මෙම ඉදිකිරිමේ කටයුතු සඳහා අවසරය ලබා දී තිබුණේ 2014 වර්ෂයේදි නිම කිරිමේ අපේක්ෂාවෙන් වුවද, විගණනය විසින් එම වැඩබිම පරික්ෂා කළ 2014 දෙසැම්බර් 11 දින වන විටත් එහි නිම කර තිබුණේ පළමු අදියර වූ කොන්ක්‍රීට් සැකිල්ල (Concrete Structure) පමණි.

**4.9 අනාර්ථික ගනුදෙනු**

කම්කරු පරීක්ෂණ, පැමිණිලි හා නඩු පරිගණක ගත කිරීමේ වැඩසටහන 2010 වර්ෂයේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගය ඇතිව දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දි තිබුණු අතර එම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කර නොතිබුණි. වැඩසටහන හඳුන්වාදීමට හා ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව 2013 සහ 2014 වර්ෂවලදී වියදම් කළ රු.39,091,100 ක මුදල අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය.

**4.10 විසඳා නොතිබුණු විගණන ඡේද**

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2013 | 5.1 ඇ | සේවක අර්ථසාධක අරමුදලේ වියදම් විසර්ජන ගිණුම සහ සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වීම. |
| 2013 | 5.5 | උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකිරීම. |
| 2013 | 6.3(i) | දෙපාර්තමේන්තුවෙන් මිලදීගෙන එහි මුද්‍රණාලයට භාර දී තිබුණු රු.4,674,100ක් වටිනා මුද්‍රණ ද්‍රව්‍ය මුද්‍රණාලයේ තොග ලේඛණයේ ද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම් ලෙස සටහන් නොකිරීම. |
| 2013 | 6.3(ii) | වාහනවල ඉන්ධන දැවීම පිළිබඳ සමීක්ෂණ මණ්ඩලය එක් එක් වාහනය සඳහා විවිධ නිර්ණායක භාවිතා කරමින් සහ විනිවිද භාවයකින් තොරව එක් එක් වාහනය සඳහා ඉන්ධන ලීටරයකින් ධාවනය වන කිලෝමීටර් ප්‍රමාණය නිර්දේශ කිරීම. |
| 2013 | 6.4(ආ)(iv) | වාහනවල ඉන්ධන පරීක්ෂාව සඳහා පත්කළ සමීක්ෂණ මණ්ඩලයට රාජකාරි පවරා වසර දෙකක් ගත වූවද, වාහන 53 ක එනම් සියයට 57 ක ප්‍රමාණයක් පමණක් පරීක්ෂා කර තිබීම. |
| 2013 | 6.6 | HEIDELBERG-GTO-52-1 වර්ගයේ මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීම සහ කාර්යක්ෂම හා ඵලදායක ලෙස එම යන්ත්‍රය භාවිතා නොකිරීම. |

## 4.11 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ 2015 පෙබරවාරි 11 දිනට හිඟහිටි රු.38,953,704 ක දායක මුදල් හා අධිභාර අය කර ගැනීම් අවස්ථා 280 ක් සහ සේවක පාරිතෝෂිත හා වෙනත් නඩු 27 කින් රු.9,829,418 ක් අයකර ගැනීම සඳහා ගෙන තිබූ අධිකරණ ක්‍රියාමාර්ග නැවතී තිබුණි.

(ආ) උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු බලප්‍රදේශයට අයත් සේවායෝජක ආයතන 17 ක රු.3,776,618 ක හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට නිතී ක්‍රියා 02 නිවේදනය යවා දින 14ක් ඇතුළත මුදල් නොගෙවූ ආයතන වෙත අවසාන නිවේදන නොයැවූ අවස්ථා 17 ක් ද, රු.35,809,694 ක් වූ හිඟදායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා රතු නිවේදන යවා දින 14 ක් ඇතුළත ගෙවීම් නොකළ ආයතන සඳහා අධිකරණ ක්‍රියාමාර්ග නොගත් අවස්ථා 38 ක් ද නිරීක්ෂණය විය. මෙසේ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම් ප්‍රමාද විම නිසා සේවකයින්ට හිමිවිය යුතු ප්‍රතිලාභ අහිමිවීමේ අවදානමක් පැවතුණි.

(ඇ) වාරික ගෙවීම පැහැර හරින ආයතන වෙනුවෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම හෝ වාරික ලෙස නැවත දන්වා අයකර ගැනීමට උත්සාහ කළ යුතු වුවත්, ගෙවීම් පැහැර හරින ලද සේවායෝජක ආයතන 11 ක් විසින් ගෙවිය යුතු රු.2,382,164 ක මුදල, වාරික වශයෙන් ගෙවීමට කම්කරු කොමසාරිස් ජනරාල් විසින් අවස්ථාව ලබා දී තිබුණද එය පැහැර හැරීම සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම හෝ වාරික ලෙස අයකර ගැනීමට 2015 ජනවාරි 27 දින වන විටත් උත්සාහ කර නොතිබුණි.

(ඇ) උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු බලප්‍රදේශය තුළ පිහිටි කලාප 12 ට අයත් ආයතන අතරින් විධිමත් පරීක්ෂාවකින් තොරව අක්‍රිය ආයතන ලෙස හඳුනාගත් ලිපිගොනු 3050 පමණ තිබුණු අතර වසා දැමූ ආයතනවල සේවකයින්ට හිමි දිමනා ගෙවා තිබේද යන්න විගණනයට අනාවරණය නොකෙරුණි.

(ඉ) උතුරු කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට 2015 මාර්තු 04 දිනට ලැබී තිබුණු එකතුව රු.1,335,914 ක මුදල් අදාල හිමිකරුවන්ට ලබා නොදී පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. මෙම මුදලින් රු.340,141 ක්, රු.75,600 ක්, රු.616,368 ක් හා රු. 68,820 ක් පිළිවෙලින් අවුරුදු 5,4,3 හා 2 ට වැඩි ප්‍රේෂණ මුදල් විය.

**4.12 මානව සම්පත් කළමනාකරණය**
**---------------------------------**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**
**-----------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 205 | 147 | 58 | - |
| (ii) | තෘතියික මට්ටම | 667 | 408 | 259 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,497 | 1,278 | 219 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 443 | 423 | 20 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 5 | - | 5 |
| | **එකතුව** | **2,812** | **2,261** | **556** | **5** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 556 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) ද්විතියික මට්ටමේ සේවක සංඛ්‍යාව ඇතුළත ලිපිකරු තනතුරු 2 ක් අතිරික්තව පැවති අතර ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**
**--------------------------------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාල පරිච්ජේදය |
| --- | --- | --- | --- |
| කම්කරු නිලධාරි | 1 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2014.08.26 දින සිට 2015.06.19 දින දක්වා |
| කම්කරු නිලධාරි | 1 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2011.02.14 සිට 2015.01.25 දින දක්වා (විශ්‍රාම ලබා ඇත) |
| මානව සම්පත් නිලධාරි | 1 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2014.08.26 දින සිට 2015.0619 දින දක්වා |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 1 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2002.01.01 දින සිට 2015.06.19 දින දක්වා |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 1 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2004.05.03 දින සිට 2015.06.19 දින දක්වා |